සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

RICHMOND COLLEGE LIBRARY
GALLE

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය
## ඉස්ලාම් ධර්මය

නම/විභාග අංකය :- ........................................................................................ කාලය : 02යි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ඉතා සුදුසු නිවැරදි පිළිතුර තෝරන්න.

01. 'රිසාලත්' යන අරාබි පදයෙහි තේරුම,
    (1) ඒක දේවත්වය (2) දූත මෙහෙවර (3) පරමාත්ථ ජීවිතය (4) නබිත්වය

02. අල්ලාහ් හැර වෙනත් දෙවියෙකුට මනංකල්පිතව නැමදීම.
    (1) රිද්දත් (2) කුෆ්ර් (3) ෂිර්ක් (4) නිෆාක්

03. ඉද්රීස් (අලෛ) තුමාට ප්‍රදාන කරන ලද සුහුෆ් සංඛ්‍යාව,
    (1) 30 (2) 50 (3) 10 (4) 04

04. 'උපවාසය' යන අරුත දෙන අරාබි පදය,
    (1) රමළාන් (2) සලාත්
    (3) සදකා (4) සවුම්

05. තනිව ඉටු කරනවාට වඩා සලාතය සමූහ වශයෙන් ඉටුකරන විට මෙවන් ගුණයකින් ආනිසංස වැඩි වේ.
    (1) 15 කින් (2) 27 කින් (3) 17 කින් (4) 7 කින්

06. අල්ලාහ්ට වාජිබ්බන ගුණාංග අතරින් ''ඉරාදත් '' යන්නෙහි අරුතය.
    (1) අභිමතය (2) දැනුම (3) පැවැත්ම (4) දෘෂ්ටිය

07. මලක්වරුන්ගේ නායකයා,
    (1) ඉස්රාඊල් (අලෛ) (2) ඉස්රාෆීල් (අලෛ) (3) ජිබ්රීල් (අලෛ) (4) මීකාඊල් (අලෛ)

08. පරමාත්ථයෙහි මුලින්ම විමසනු ලබන අමල්,
    (1) සකාත් (2) හජ් (3) සවුම් (4) සලාත්

09. රමළාන් මාසයේ විශේෂිතව ඉටුකරන සුන්නත් සලාතය
    (1) තහජ්ජුත් (2) තස්බීහ් (3) තරාවීහ් (4) විත්රු

10. පහත සඳහන් කරුණු අතරින් ෆර්ළු ඓන් වූ වගකීම,
    (1) ඊද් සලාත් (2) විත්රු සලාත්
    (3) ජනාසා සලාත් (4) පස්වේල් සලාතයන්

11. ප්‍රථමයෙන්ම නබි (සල්) තුමාණන්ට පහළ වූ කුර්ආන් වැකි ගණන,
    (1) 5 කි. (2) 6 කි. (3) 10 කි. (4) 8කි.

12. සවුම් අනිවාර්ය කරන ලද වර්ෂය,

(1) හිජ්රි 1 (2) හිජ්රි 2 (3) හිජ්රි 3 (4) හිජ්රි 4

13. 'වැළඳගැනීම' යන අරුත දෙන අරාබි පදය,

(1) මුසාෆහා (2) මුහාසබා (3) මූජාදලා (4) මුආනකා

14. ''ප්‍රාර්ථනාව දේව නැමදුමකි'' යනු,

(1) කුර්ආනීය අදහසකි. (2) හදීස් වදනකි.

(3) විද්වත් ප්‍රකාශයක් (4) පැරන්නන්ගේ වදනකි.

15. ජල වර්ග අතරින් 'අල්මාඋත් තහූර්' යනු,

(1) අති පිරිසිදු ජලය (2) පිරිසිදු ජලය

(3) අපිරිසිදු ජලය (4) පරිහරණය වූ ජලය

16. නබි (සල්) තුමාගේ කියමන්, ක්‍රියා, අනුමත කිරීම් යනාදි හැඳින්වෙන පදය,

(1) අස්සීරා (2) අත්තාරීඛ් (3) අල්හදීස් (4) අල් කද්ර්

17. නබි (සල්) තුමාණන්ට ප්‍රථම වහී පහළ වූ ස්ථානය,

(1) තෞර් ගුහාව (2) හිරා ලෙන (3) බද්ර් පිටිය (4) අරෆා පිටිය

18. තුවාලයට යෙදෙන වෙළුම අරාබියෙන් මෙසේ හැඳින්වේ.

(1) ජනාබත් (2) මස්හු (3) ජබීරත් (4) තයම්මුම්

19. තයම්මුම් සඳහා වූ අවයව,

(1) මුහුණ සහ දෙපා (2) මුහුණ සහ දෑත් (3) මුහුණ සහ හිස (4) හිස සහ දෑත්

20. මෘදු (සරල) නජීස් යනු,

(1) බල්ලාගේ සහ ඌරාගේ අපවිත්‍ර දෑ

(2) සාමාන්‍යය වශයෙන් පවතින අපවිත්‍රයන්.

(3) ලේ, වමන යනාදී

(4) අවුරුදු දෙකට අඩු, මව්කිරි පමණක් ආහාරයට ගන්නා පිරිමි දරුවාගේ මුත්‍රා

## II කොටස

- **කොටස් 'අ' , 'ආ' අතරින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් බැගින් තෝරා , පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමුවෙනි ප්‍රශ්නයට ලකුණු '16' ක්ද, අනෙකුත් එක් එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු '11' ක් බැගින් ද හිමි වේ.**

01. පාසල් පාදක ඇගයීම ක්‍රියාවලියෙහි ''පිරිසිදුකම'' යන තේමාව යටතේ ඔබ විසින් ඉටු කරනු ලද පැවරුම පදනම් කරගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ඉස්ලාම් හි පිරිසිදුකමෙහි වැදගත්කම හුවා දක්වන කරුණු පහදන්න.

(2) ස්නානයේ වර්ග දෙක සඳහන් කරන්න.

(3) මහා කිල්ල ඇති වූවන් හට තහනම් වූ කරුණු තුනක් ලියා දක්වන්න.

(4) ස්නානය සඳහා භාවිතා කළ යුතු ජල වර්ගය ලියන්න.

(5) පිරිසිදුභාවය රැකීමෙන් අත්වන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

(6) සුන්නත් වූ ස්නාන තුනක් නම් කරන්න.

'අ' කොටස

02. (1) ඊමාන්හි කොටස් දෙක සඳහන් කරන්න.

(2) අල්ලාහ්ගේ ගුණාංග තුනක් සඳහන් කරන්න.

(3) නජිස් වර්ග විස්තර කරන්න.

(4) මලක්වරුන්ගේ ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

03. (1) සික්ර් (දික්ර්) හි වර්ග දෙක සඳහන් කරන්න.

(2) උපවාසයේ යෙදීම තහනම් වූ දිනයන් ලියා දක්වන්න.

(3) ප්‍රාර්ථනාවන් ඉටුවීමට තිබිය යුතු කොන්දේසි තුනක් සඳහන් කරන්න.

(4) සමාජය විසින් සුරැකිය යුතු කොටස් තුනක් සඳහන් කරන්න.

04. (1) සුහුෆ් 10 බැගින් ප්‍රදානය කරන ලද නබිවරු දෙදෙනෙක්ව නම් කරන්න.

(2) ලෛලතුල් කද්ර් රාත්‍රියෙහි ඉටුකළ යුතු යහක්‍රියාවන් තුනක් සඳහන් කරන්න.

(3) සුන්නාහ් කෙරෙහි අපගේ වගකීම් කුමක්ද?

(4) අල්ලාහ් විසින් නබිවරුන් හට පහළ කරන ලද ආගම් තුනක් නම් කර අදාළ භාෂාවද සඳහන් කරන්න.

'ආ' කොටස

05. (1) ඉස්ලාම්හි ප්‍රධාන මූලාශ්‍රයන් දෙකක් නම් කරන්න.

(2) අන්සතු දෑ අනුමැතියෙන් තොරව භාවිතා කිරීමෙන් සිදුවන බලපෑම් තුනක් සඳහන් කරන්න.

(3) අල්ලාහ් ගේ ස්නේහයට පාත්‍ර වීමට කළ යුතු කරුණු තුනක් සඳහන් කරන්න.

(4) මිත්‍රත්වය සදා පවත්වාගැනීමට ඉස්ලාම් දක්වන ක්‍රමවේද තුනක් ලියන්න.

06. (1) සලාතයේ ෂර්ත් අතරින් එකක් සඳහන් කරන්න.

(2) අල්ලාහ්ගේ ගුණාංගයන් ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදෙයි. එම තුන නම් කරන්න.

(3) ඊමාන් ශක්තිමත් වන විට ඇතිවන්නාවූ ගුණාංග තුනක් සඳහන් කරන්න.

(4) පිරිසිදු කම අනිවාර්ය වන ඉබාදත් තුනක් සඳහන් කරන්න.

07. (1) 'දුආ', 'දික්ර්' යන අරාබි පදයන් හි තේරුම් ලියන්න.

(2) මුඃමින්වරයෙකු අල්ලාහ් සිහිපත් කරගෙන ජීවත්වීමට ඉස්ලාම් දක්වන ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න.

(3) වාර්ෂිකව රැකිය යුතු සුන්නත් සවුමයත් සඳහන් කරන්න.

(4) ජමාඅත් වශයෙන් සලාත් ඉටුකරන කල ඇතිවන්නාවූ යහගුණ තුනක් සඳහන් කරන්න.